## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - 2013

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක **38** දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වගන්තියේ හා 1 උප වගන්තිය අනුව සහ 1974 අගෝස්තු 14 දිනැති හා 124/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ **14(2)(සී)** වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් **2013** දෙසැම්බර් **31** දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009-2011 කාලපරිච්ඡේදය තුළදී මධ්‍යස්ථානයට ලැබුණු විදුලි පහන් නියැදි **70** ක් සඳහා පරීක්ෂණ ගාස්තු අය කිරීමකින් තොරව පරීක්ෂණ වාර්තා නිකුත් කර තිබුණි. මේ සඳහා මධ්‍යස්ථානයට අයවිය යුතු රු. 633,288 ක් වූ පරීක්ෂණ ගාස්තු ඒ ඒ වර්ෂවල ආදායම් හා අයවිය යුතු ගාස්තු (ණයගැතියන්) ලෙස ගිණුම්ගත කර නොතිබුණි .

(ආ) රු. 1**,765,179** ක් වටිනා කෞතුකාගාර භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ දී දේපල, පිරියත හා උපකරණ ලෙස ගිණුම් ගත කර තිබූ අතර, ඒ අනුව කෞතුකාගාර භාණ්ඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා දේපල, පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළ ක්‍රමක්ෂය රු. **60,585,395** ක් වුවද, රු. **60,354,983** ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය රු. 230,412 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.**2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 201**3** දෙසැම්බර් 31 දිනට වෙළෙඳ හා වෙනත් ණයගැති ගිණුම් 21 කින් සමන්විත වී තිබූ රු. 17,000,942 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 1ත් වර්ෂ **3** ත් අතර වූ ණයගැති ශේෂය රු. 49,542 ක් හා වර්ෂ **8** ට වැඩි ණයගැති ශේෂය රු. 1,229,722 ක් ද විය.

(ආ) එකතුව රු. **2,842,276** ක් වූ වෙළෙඳ ණයහිමි ශේෂය තුළ රු. 252,160 ක් වර්ෂ **05** කට වැඩි කාලයක් ද, රු. 198,812 ක් වර්ෂ 02 කට වැඩි කාලයක් ද නිරවුල් කර නොතිබුණි.

2.2.**3** ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2012 මැයි 22 හා 2013 මැයි 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත 2012 වර්ෂයේ සිට වාණිජ ව්‍යාපෘති ලාභයෙන් දිරි දීමනා ගෙවීම සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබූ අතර එහෙත් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී වාණිජ ව්‍යාපෘති ලාභයෙන් රු. **5**,029,560ක් ද පෙර වර්ෂයේ දී රු. 3,340,442 ක් ද දිරි දීමනා සඳහා වැය කර තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට **50** කින් සමාලෝචිත වර්ෂයේ දිරි

දීමනා ලෙස වැය කළ මුදල වැඩි වී තිබූ අතර, ඊට හේතු වී තිබුණේ සමාලෝචිත වර්ෂයේ දී බොහෝමයක් වාණිජ ව්‍යාපෘතිවලින් ලාභ ලැබීම බව සභාපති විසින් විගණනයට දක්වා තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මුදල් රෙගුලාසි **104, 105, 106, 110** | ඉකුත් වර්ෂයේ වාහන **04** කට සිදු වූ එකතුව රු. **239,694** ක් හා සමාලෝචිත වර්ෂයේ වාහන **03** කට සිදු වූ එකතුව රු.**138,422** ක් වූ අනතුරු ද, බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති "සහසක් නිමැවුම්"" ප්‍රදර්ශනයේ දී මධ්‍යස්ථානයේ වත්කම්වලට සිදු වූ රු. **277,095**ක් වූ ගිනි හානි සම්බන්ධවද මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) **1971** අංක **38** දරන මුදල් පනතේ **8** (II) වගන්තිය, **2004** ජුනි **29** දිනැති අංක PED/25 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා **2006** ජුනි **27** දිනැති අංක **PF/PE/9** දරන රජ්‍ය මුදල් චක්‍රලේඛය | ගරු මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව රු.**207,000** ක මුදලක් ස්ථාවර තැන්පතුවල හා රු.**66,934,804** ක මුදලක් රාජ්‍ය බැංකුවක සත්දින ඒක්ෂණ තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ඇ) 2006 සැප්තැම්බර් 27 දිනැති හා අංක **PED/40** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලට නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවලට අදාළ කරගත නොහැකි වුව ද, 2011 දෙසැම්බර් 11 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පදනම් කර ගනිමින් **2013** සැප්තැම්බර් **25** දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට ගෙවනු ලබන රු.15,000 ක මාසික දීමනාව මධ්‍යස්ථානය ඉංජිනේරුවරුන් 40 දෙනෙකුට එකතුව රු.**600,000** ක් ගෙවා තිබුණි. 2013 වර්ෂයට අදාළ දීමනා ගෙවීම සඳහා මධ්‍යස්ථානයේ වාණිජ ව්‍යාපෘති ලාභය උපයෝගි කරගෙන තිබූ නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය හෝ අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. |
| (ඇ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 (2) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756,757 හා 771 | (i) අපහරණය කළ යුතු රු. **1,104,447** ක් වටිනා තොග අපහරණය කර නොතිබුණි.<br><br>(ii) භාණ්ඩ/වත්කම් භෞතිකව පරීක්ෂා කර ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව ශේෂය, භෞතික ශේෂය, අතිරික්තය, ඌනතාවය |

ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුව ද රු.**427,191,173** ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණේ භාණ්ඩ ඌනතාවය හානි වූ තොග ඇතුළත් වාර්තාවක් පමණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 29,621,795 ක ඌණතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපී ඌණතාවය රු. 24.846,134 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.**4,775,661** කින් පිරිහීම කෙරෙහි පරිපාලන වියදම් රු.**28,231,334** කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව 2009 – 2013 වර්ෂ **05** ක කාලපරිච්ඡේදය තුළ දී මධ්‍යස්ථානයේ පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | වර්ෂය | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2010 | 2009 | |
| ආරම්භ කළ පර්යේෂණ | 08 | 18 | 16 | 14 | 09 | 65 |
| අවසන් කරන ලද පර්යේෂණ | - | 13 | 15 | 11 | 07 | 46 |
| අත්හැර දමන ලද පර්යේෂණ | - | 01 | - | 02 | 06 | 09 |
| සාර්ථක නොවූ පර්යේෂණ | - | 01 | 02 | 02 | 01 | 06 |
| තාක්ෂණය පවරන ලද පර්යේෂණ | - | - | 01 | - | - | 01 |
| භාවිත කරන ලද පර්යේෂණ | - | 06 | 06 | 03 | 01 | 16 |

(ආ) භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. 7,019,692 ක් වැය කර 2009 – 2013 කාල පරිච්ඡේදවල ආරම්භ කරන ලද පර්යේෂණ 15 කට අදාළව පර්යේෂණ ව්‍යාපෘති කටයුතු අවසන් වී තිබුණ ද අවසන් වාර්තා මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදුලි උත්පාදන පද්ධතියක් ක්‍රියාත්මක කර විදුලිය නිපදවීමේ අරමුණින් 2004 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අරමුණු කරා ලඟාවීමට නොහැකිවීමෙන් සමාලෝචිත වර්ෂයේ දී අත්හැර දමා තිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් හා ඉදිකරන ලද රු. 4,740,000 ක වත්කම් හා ඇමරිකානු ඩොලර් **86**,250 ක් වටිනා විදුලි උත්පාදන යන්ත්‍ර නිෂ්ක්‍රියව තිබුණි. ව්‍යාපෘතිය සඳහා දරා ඇති අනෙකුත් පිරිවැය රු. 34,165,937 ක් වන අතර එයින් රු. 32,913,445 ක මුදලක් දරා තිබුණේ විදුලි යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙනි.

(ආ) 2005-2013 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් මධ්‍යස්ථානයට ප්‍රතිපූර්ණය කරගත හැකි රු. 29,985,277 ක එකතු කළ අගය මත බදු මුදල් හා රු. 239,092 ක රඳවා ගැනීමේ බදු මුදල් සමාලෝචිත වර්ෂයේ දී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **2011** වර්ෂයට සාපේක්ෂව පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2012 හා 2013 වර්ෂවලදී මධ්‍යස්ථානයේ ආනයනික බැටරි පරීක්ෂා කිරීමේ වාණිජ ව්‍යාපෘතිය සඳහා ලැබූ වැඩ ඇණවුම් අඩුවීම හේතුවෙන් ව්‍යාපෘති ආදායම් අඩුවී තිබුණි. බැටරි පරීක්ෂා කිරීම අඩුවීම හේතුවෙන් ආනයනික බැටරි පරීක්ෂා කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් පසුගිය වර්ෂවල දී මිලදී ගෙන තිබූ රු. 17,773,523 ක් වටිනා යන්ත්‍ර උපකරණ ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) **2009** සිට **2012** වර්ෂවලදී ආනයනික විදුලි පහන් පරීක්ෂාව සඳහා රු.**7,886,566** ක් වූ ලැබීම්වලට අදාළ ඇණවුම් **698** ක් සඳහා කාර්යසාධන වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එම වාණිජ ව්‍යාපෘතියේ ආදායම පසුගිය වර්ෂවලදී සීඝ්‍රයෙන් අඩුවී තිබුණි. ඒ අනුව 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී ශුද්ධ ආදායම සියයට 51 කින්ද 2013 වර්ෂයේ දී සියයට **83** කින් ද අඩුවී තිබුණි.

(ඉ) 2002 සිට **2013** දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රු. 63,518,112 ක මුදලක් සත්දින ඒක්ෂණ තැන්පතුවල අඩුපොළී අනුපාතයක් යටතේ රඳවා තිබුණි. මෙම මුදල් වැඩි පොළී අනුපාතයක් ලබාගත හැකි ආයෝජන ක්‍රියාමාර්ග වෙත යොමු කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඊ) 2011 වර්ෂයේ සිට **ISO – 9001** පද්ධති සහතිකකරණය මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කිරීම සඳහා එම වර්ෂයේදී රු. 203,850 ක් වැයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 03 ක් ගත වී තිබුණද පද්ධති සහතිකකරණය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය විසින් 2013 අගෝස්තු 27 දින පෞද්ගලික ආයතනයකින් රු. 2,313,584 කට ඩස්ට් සාම්ප්ලර් යන්ත්‍රයක් මිලදී ගැනීමට ඇණවුමක් ඉදිරිපත් කර තිබූ අතර 2013 නොවැම්බර් 26 දින අදාළ යන්ත්‍රය සැපයිය යුතු වුවත් 2014 පෙබරවාරි මාසය අවසාන වන විටද සැපයුම සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) 2002 වර්ෂයේදී රු. 10,984,594 ක් වැය කර මීගමුව නගර සභාව සඳහා මළ අපහරණ පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ ද, පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම මත නගර සභාව විසින් ව්‍යාපෘතිය භාර ගෙන නොතිබූ බැවින් 2013 දෙසැම්බර් 31 වන විට අයවිය යුතු රු. 2,128,636 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මධ්‍යස්ථානයට විවිධ ව්‍යාපෘති සඳහා සේවාදායකයින්ගෙන් ලැබී ඇති රු. **4,649,870** ක අත්තිකාරම් මුදල් තුළ **2010** වර්ෂයේ දී විදුලි පහන් පරීක්ෂාවක් සඳහා රාජ්‍ය ආයතනයකින් රු.**1,642,500** ක් ලබාගෙන ඇතත් පරීක්ෂාවන් මෙතෙක් සිදු කර නොමැති නිසා අවුරුදු **04** ක සිට නිරවුල් නොවී පැවති අතර රු.**15,000** ක මුදලක ව්‍යාපෘති **02** ක් ක්‍රියාත්මක නොකිරීම නිසා අත්තිකාරම් ගිණුමේ තවදුරටත් පැවතුණි.

(ඈ) 2003-2005 කාලපරිච්ඡේදය තුළදී සේවාදායකයින් **09** දෙනෙකු වෙත කුළියට ලබා දුන් යකඩ තහඩු (Shutter set) 2013 දෙසැම්බර් 31 දින වන විට ද නැවත මධ්‍යස්ථානයට භාර දී නොතිබුණි. ඒ සඳහා සේවාදායකයින්ගෙන් ලබා ගත් රු.105,500 ක තැන්පතු සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද යකඩ තහඩු නැවත ලබා ගෙන සේවාදායක අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා උපදේශක සේවා සැපයීමෙන් හා මධ්‍යස්ථානයේ තාක්ෂණය භාවිතයෙන් අඩු වියදම් ඉදිකිරීම් රාජ්‍ය අංශයට හඳුන්වාදීමේ අරමුණෙන් ආරම්භ කළ ව්‍යාපෘතියෙන් රු. 3,000,000 ක ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණද අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වී තිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ එක් එක් අංශ සඳහා මිලදී ගෙන ඇති රු. 47,606,810 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ **10** ක් වර්ෂ **01** සිට **07** ක් දක්වා ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව තිබුණි.

(ආ) මධ්‍යස්ථානයට අයත් ප්‍රධාන තොග ගබඩාවේ රු. 2,357,210 ක් වූ තොග අයිතම 64 ක් වර්ෂ 13 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) තාක්ෂණ හා පශු සම්පත් අංශය විසින් රු. 770,792 ක් වැයකර නිපදවන ලද හයිඩ්‍රොලික් ප්‍රී ස්ටෙසින් යන්ත්‍රයක් අවුරුදු 04 ක සිට ඌණ උපයෝජිතව පැවතුණි.

**4.5** ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------------

සැලසුම් නිර්මාණ හා උපදේශන සේවා අංශයේ අවුරුදු **02** කට අධික කාලයක් ක්‍රියාවිරහිතව තිබූ සී. එන්. සී මිලින් යන්ත්‍රයක් පැමිණ පරීක්ෂා කිරීම සඳහා විදේශීය පරීක්ෂකවරයෙකුට සමාලෝචිත වර්ෂයේදී රු. 1,968,270 ක් ගෙවා තිබුණි. අවස්ථා තුනකදී අළුත්වැඩියාවක් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද යන්ත්‍රය ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබුණි.

**4.6** හඳුනාගන්නා ලද පාඩු

--------------------------

සමාලෝචිත වර්ෂයේදී නිමවූ වාණිජ ව්‍යාපෘති **03** කින් මධ්‍යස්ථානයට රු. 205,326 ක අලාභයක් සිදුවී තිබුණි.

4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

------------------------------------------

පොළොන්නරුව මහ රෝහලේ හෙද නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2011 ජූනි **17** දින රු. 24,293,400 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුවක් මත ඉදිකිරීම් කටයුතු සිදු කළ ද 2014 මාර්තු මාසය වන විටද තාක්ෂණික ඇගැයීම් කමිටු අනුමැතිය ලැබී නොතිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් අභ්‍යාස සංවර්ධන පුහුණු ආයතනයේ (ඉක්ටැඩ්) මාර්ගෝපදේශ **33.6** හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **8.9** ඡේද අනුව මෙම කොන්ත්‍රාත්තුව පවරා දී අවුරුදු **03** ක් ගත වී තිබුණද මෙතෙක් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කළ බිල්පත්වලින් මධ්‍යස්ථානයට ලැබිය යුතු රු.**9,176,421** ක මුදල විගණන දිනය වූ 2014 පෙබරවාරි 20 දින වන විට ද අයකර ගෙන නොතිබුණි.

(ඇ) අතිරේක වැඩ (Extra Works) වටිනාකම රු. 2,984,169 ක් වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අතිරේක වැඩ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2011 අප්‍රේල් 15 දින ආරම්භ වී මාස 04 කින් නිමකිරීමට නියමිතව තිබුණ ද 2013 පෙබරවාරි 22 වන දින නිමකර තිබුණි. ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා අය වීමට ඇති රු. 2,047,560 ක මිල විචලනයන් ලැබීම සැක සහිත බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**4.8** ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිරි ගවයින් සඳහා ආහාර කැට නිෂ්පාදනය කිරීමේ උපකරණයක් සැකසීමේ ව්‍යාපෘතිය 2006 ජුලි **01** ආරම්භ කර 2006 සැප්තැම්බර් **30** දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද ව්‍යාපෘතිය නිම කිරීම 2008 වර්ෂය දක්වා ප්‍රමාද වි තිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද මුළු පිරිවැය රු. 2,144,290 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද යන්ත්‍රය අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත හැකි ආකාරයට ක්‍රියාත්මක කිරීමට නොහැකි වි ඇති බව නිරීක්ෂණය විය. මෙම යන්ත්‍රය වෙනුවෙන් 2009 වර්ෂයේ සිට ලැබිය යුතු ණය ශේෂය රු. **371,152** ක් විය.

(ආ) " Demining Robot " නැමැති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමඟ **2012** ජුනි **01** දින අවබෝධතා ගිවිසුමකට එළඹ මොරටුව විශ්වවිද්‍යාලයට රු. 1,085,662 ක මුදලක් **2012** අගෝස්තු **20** දින හා **2013** ජනවාරි **11** දින ලබාදී තිබුණි. 2012 ජුනි මාසයේදී ව්‍යාපෘතිය ආරම්භ කර 2013 ජුලි මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද ව්‍යාපෘතිය අවසන් කර නොතිබූ අතර ව්‍යාපෘතියේ කිසිදු ප්‍රගතියක් විගණනයේදී නිරීක්ෂණය නොවීය.

**4.9** අත්හැර දැමූ ව්‍යාපෘති

2009-2013 කාලපරිච්ඡේදය තුළ පිරිවැය රු.**3,066,060** ක පර්යේෂණ **19** ක් අත්හැර දැමීම නිසා එම ව්‍යාපෘති වෙනුවෙන් දැරූ වියදම් ආර්ථික නොවන ගනුදෙනු ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

**4**.10 ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම/ අසාර්ථක වූ ව්‍යාපෘති

ව්‍යාපෘති 16 ක් සඳහා වාර්ෂික පර්යේෂණ වියදම් ලෙස රු.55,316,080 ක් ගිණුම්වලින් ලියාහැර තිබුණ ද පර්යේෂණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. මෙම ව්‍යාපෘති වෙනුවෙන් මිලදීගත් හා නිපදවනු ලැබූ යන්ත්‍ර භාවිතා නොකර නිෂ්ක්‍රීයව පවතින බවද නිරීක්ෂණය විය.

**4**.11 කාර්ය මණ්ඩල පරිපාලනය

මධ්‍යස්ථානයේ **2013** දෙසැම්බර් **31** දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ.

| තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 79 | 51 | 28 | - |
| විධායක නොවන | 229 | 223 | 42 | 19 |

කළමනාකාර සහකාර තාක්ෂණික නොවන (පරීක්ෂණ සේවා) කාර්ය මණ්ඩලය සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013 ජනවාරි 31 දින අනුමත කළ කාර්ය පරිපාටියෙන් බැහැරව අදාළ ක්ෂේත්‍රයේ අවුරුද්දක පලපුරුද්දක් නොමැති නිලධාරීන් 04 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන වැටුප් වෙනුවට මාසික දීමනා ලෙස 2013 ජූනි සිට දෙසැම්බර් දක්වා රු. 170,626 ක් ගෙවා තිබුණි.

## 5 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 11 සිට සියයට 43 දක්වා සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මධ්‍යස්ථානයේ සභාපති වෙත යොමුකරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

(අ) ව්‍යාපෘති පිරිවැයකරණය හා කළමනාකරණය
(ආ) ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය
(ඇ) ණයගැතියෝ
(ඈ) යන්ත්‍ර සූත්‍ර උපයෝජනය
(ඉ) වාහන පාලනය